# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,369 - 2024 ජනවාරි මස 26 වැනි සිකුරාදා - 2024.01.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 30 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 32 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 පෙබරවාරි 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කඩුවෙල දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

1994 අංක 09 දරන පනතෙන් සංශෝධිත පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 (1) වගන්තිය යටතේ පවරන ලද නඩුකරය.

*නඩු අංකය* : DDR/582/17 (කොළඹ දිසා අධිකරණ)
*ස්වභාවය* : ණය මුදල් ආපසු අයකර ගැනීම
*වටිනාකම* : රු. 72,004,558/-
*පටිපාටිය* : ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නියමිත විශේෂ
*ඇස්කිසි අංකය* : 87/2019 (කඩුවෙල දිසා අධිකරණ)

ප්‍රයිම් ෆයිනෑන්ස් පීඑල්සී.
(කලින් සමිට් ෆයිනෑන්ස් පීඑල්සී, ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් පීඑල්සී, ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්, දිවැස ෆයිනෑන්ස් ලිමිටඩ් සහ ඒෂියා කොමර්ස් ලිමිටඩ් යන නමින් හඳුන්වනු ලැබූ)

නගර කාර්යාලය, අංක 15, දුම්රියපොල පාර, කොළඹ 03.
(සමාගමේ නව අංකය - පීකිව් 351)

*සහ දැනට,*

අංක 61, ඩී. එස්. සේනානායක මාවත,
බොරැල්ල, කොළඹ 08.

*සහ දැනට,*

එච්. එන්. බී. ෆිනෑන්ස් පීඑල්සී,
(කලින් ප්‍රයිම් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 2022.05.12 දින ඒකාබද්ධ වීමෙන් පසු)
අංක 168, නාවල පාර, නුගේගොඩ.
(සමාගමේ නව අංකය - පීබී 965 පීකිව්)

*......................පැමිණිලිකරු.*

*එදිරිව*

1. දොන් චමින්ද ජයනාත් කටුගම්පොල
2. උමගිලිය විතානගේ දුලාෂිනි අන්ජනා රාජකරුණා
   කඩුවෙල, හේවාගම, අංක 82 දරන ස්ථානයේ 'නිව් කඩුවෙල එන්ටර්ප්‍රයිසස්' යන නාමය, විලාශය සහ ව්‍යාපාර නාමය යටතේ හවුල්කරුවන් ලෙස ව්‍යාපාර කරගෙන යයි.

3. මාජුවාන ගමගේ ප්‍රේමවතී,
   අංක 113/6, හේවාගම, කඩුවෙල.

*සහ*

අංක 473, බෞද්ධාලෝක මාවත, කොළඹ 08.

*......................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ පහත උපලේඛනගත දේපළ විකිණීම සඳහා මා වෙත නිකුත් කර ඇති රිට් බලපත්‍රය අනුව කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2018/02/20 දින නෛසයි තීන්දුව හා නියත තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරුවන් ක්‍රියා නොකිරීම මත එකී විත්තිකරුවන්ට විරුද්ධව ඇස්කිසි ගැනීමට පැමිණිල්ලට අවසර ලබා දී ඇති බැවින්,

ඒ අනුව පැමිණිල්ලට විත්තිකරුවන්ගෙන් අයවිය යුතු රු. 72,004,558/-ක මුදලක් සහ රු. 11,170,972/-ක මුදල මත වර්ෂ 2017ක් වූ ජුනි මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා වර්ෂයකට 25% බැගින් පොළිය ද, ඊට පසු මෙකී දිනයේ සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් එම අනුපාතිකය මත පොළිය ද, නඩු ගාස්තු සහ ඇස්කිසි ගාස්තු පැමිණිල්ලට අයකරවා ගැනීමට පහත උපලේඛනයේ දක්වෙන දේපළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන සලස්වා ඇති පරිදි තහනමට ගැනීමෙන් පසු එකී ප්‍රතිපාදන ප්‍රකාර ව කොළඹ දිසා අධිකරණය මගින් අනුමත කරනු ලබන විකුණුම් කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී නියත තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී සහ පැහැර හැර ඇති හෙයින් කොළඹ දිසා අධිකරණය මගින් මා වෙත නිකුත් කර ඇති රිට් බලපත්‍රය අනුව පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 04 වැනි දින පෙ. ව. 11.00 ට,**

උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි අංක 75/4, හේවාගම කඩුවෙල යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහා නගර සභා බල සීමාවෙහි හේවාගම යන ගමෙහි පිහිටි ගොඩැල්ලවත්ත සහ වැලිඕවිට යන ඉඩම බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් බෙද වෙන් කරන ලද අංක 4397 සහ වර්ෂ 2003.11.02 දිනැති පිඹුර ප්‍රකාරව කැබලි අංක C දරන කොටසට මායිම් : උතුරට : පල්ලිහේන හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක D ද, දකුණට : අංක 918 දරන පිඹුරේ කැබලි අංක R ද, බස්නාහිරට : කැබලි අංක B ද යන මායිම් තුළ පර්චස් එකොළහයි දශම පහයි බිංදුව (පර්. 11.50) ක් විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 380/25 හි ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක මුදලක්, (2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන ගෙවීම් (3) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු හෝ විකිණීම සම්බන්ධයෙන් වූ වෙනත් වියදම් (4) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30ක් ඇතුලත කොළඹ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපළට පිවිසීම.-* කඩුවෙල සිට මාර්ග අංක 143 කොළඹ මාර්ගයේ කි. මී. 1.25ක් පමණ යන විට හමුවන කඩුවෙල පොලිස් ස්ථානය පසුකර මීටර් 50 ක් පමණ ඉදිරියට යන විට මාර්ගයේ දකුණු පසට හමුවන පළමු පාරට හැරී නැවත දකුණු පසට හැරී ඉදිරියට යන විට මාර්ගයේ වම්පසට හමුවන දෙවන නිවස ලෙස මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

කෞශල්‍යා තිසේරා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2024ක් වූ ජනවාරි මස 18 වැනි දින,
කඩුවෙල දිසා අධිකරණයේ දී ය.

01-415

# විවිධ දැන්වීම්

## සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

### පෙත්සම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස හා ගණන් බේරා වසා දැමීමේ රීති යටතේ, දෙහිවල, ගාලු පාර, 2 වන මහල, අංක 32 සහ දැන් කොළඹ 04, බම්බලපිටිය, ඩී. ෆොන්සේකා පෙදෙස, අංක 9A හි පිහිටි බ්ලූ ඕෂන් රියැල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සම්බන්ධ කාරණාවේ දී ය.

එච්. සී. සිවිල් නඩු අංකය : සීඑච්සී 101/2023/CO

1. නඩරාජා පරම්සෝති,

   අංක 28-5/5, බෙන් ඇන්ඩ් නැන්සි මහල් නිවාස, රාමක්‍රිෂ්ණ පාර, කොළඹ 06.

2. ශෂිකලා පරම්සෝති,

   අංක 28-5/5, බෙන් ඇන්ඩ් නැන්සි මහල් නිවාස, රාමක්‍රිෂ්ණ පාර, කොළඹ 06.

.................................*පෙත්සම්කරුවන්.*

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා පෙත්සම්කරුවන් වන කොළඹ 06, රාමක්‍රිෂ්ණ පාර, බෙන් ඇන්ඩ් නැන්සි මහල් නිවාස, අංක 28-5/5 හි නඩරාජා පරම්සෝති සහ ශෂිකලා පරම්සෝති විසින් **2023 දෙසැම්බර් මස 07 වැනි දින** එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම **2024 මාර්තු මස 04 වැනි දින** අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුවන්ගේ ලේඛනගත නීතිඥයින්,
අංක 28 (2 වන මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

*සටහන.-*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම් සඳහන් නීතිඥ ව්‍යාපාරය වන නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස් මහතුන් වෙත ලිඛිතව හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. තැපැල් මගින් එවීම අවශ්‍ය වන පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය 2024 මාර්තු මස 2 වැනි දින වේලාව පස්වරු 1.00 ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ කිරීම අවශ්‍ය වේ.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුවන්ගේ ලේඛනගත නීතිඥයින්.

01-365

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.